


යාත්‍රා කරමු අපි
උතුම් සිතිවිලි සමඟ
ගැටෙමු අපි විඳිනෙදා
සොබා දහමත් සමඟ

මත සමඟ ගැටෙනමුත්
බැඳෙමු මිනිසුන් සමඟ
කවි සිතින් ඔබෙ මතය
බෙදා ගමු ලොව සමඟ

කවි පිටුවට කවි ලියන්න
ඔබ සැමට සෙනෙහසින්
ඇරයුම් කරමු

**ඉවුර සංස්කාරක**
E-mail. ivura.kavi@gmail.com

## ප්‍රේමානිශංස

කැට කිරිලි තුඩගින් ගෙනත් දී
රසම රස පල වැල හා මල් මදු
වළඳනා තෙක්ම රැක සිට
වඩාලූ මේ ජීවිතේ මායිම්....

හෙට කියා දිනයක් ඒ ද නොම ඒ ද නොම දැන
අදය ජීවිතයේ පරමය
විඳිමු එය
කල්පාන්තය එළඹෙන්නේය හවසට

ගාලු මුවදොර සයුරු තීරය අසල
පාරමී දම් පිරූ එදවස
පිපාසෙට ලුණු වතුර බිව්වෙමු
පිපාසය සංසිඳිනි එසැණින්

අවරගිර බැස යන්න නියමිත
හිරු පමාවී දීය රැකවල්
සැඳෑවක අසිරිය දෙගුණ කොට
මැවී සිත්තම් සිතිජ ගගනත

**චන්ද්‍රරත්න බණ්ඩාර**

## ඔබේ පෙම

මියැදුන ඔබ පෙමෙන්
ලද තැවුල් ඉමහත්ය
එහෙත් ඉන් ලද නුවණ
සයුරසේ අනන්තය

**අසෝකා ජයලත්**

## ඬේවිඩ් නොහොත් සඳරේබාගේ කවිය

ඬේවිඩ් ප්‍රතිමාව
ඉස්කෝලෙ චිත්‍ර පාඩමෙ හිටියෙ
කිරිගරුඬ කඩවසම් ප්‍රතිමාව....

ඇවිත් නිර්වස්තරෙන් මගෙ ළඟට ම
රෑ දෙගොඩහරි ජාමෙ
තේ කඩේ කාමරේ මං ඉන්නකොට
පාන්දර දෙකාමාරට විතර.

දන්නෙම නෑ ළඟට එනකම්ම.

පෝන් එකෙ
ටෝච් එක පත්තුකරගෙන ඇවිත්
අමු තිත්ත කරුවලේ.

ඉතාලියෙ
හැඩකාර ඬේවිඩ්
මයිකල් ආන්ජිලෝගෙ මූර්තිය
ඇඟ පතේ ඉලිප්පුණ පිම්බිච්ච මස් ගොබ
මාර ප්‍රතිමාවක්නෙ ඬේවිඩ්.

ඉතාලියෙ ඬේවිඩ්
මේ අපේ ඬේවිඩ් ම තමයි.

ඉතාලියෙ ඬේවිඩ්ට
ලැජ්ජ බය නැති වුණත්
අන්න ඒකට අපේ ඬේවිඩ්.
විලි ලැජ්ජකාරයා.

නිතරෝම
කොට කලිසමෙන් ඉන්නෙ
බේකරියෙ පාං මෝලිය අනල
පිළිකන්නෙ ෂවර් එකෙ නාන්නෙත්
කොට කලිසම පිටින්.

තේ කඩේ කුස්සියේ
මං වඩේ බදිනකොට
ඬේවිඩුත් හොර හොරා මං දිහා බලනවා
ඊළඟට ලොරිය පල්ලට ගිහින්
බීඩියක් උරනවා.
මිල්ටන්ගෙ සිංදුවක් කියනවා.
බඩ පපුව අත ගගා
හොර හොරා මං දිහා බලනවා.

වම් අතේ
කොටියෙකුගෙ පච්චයක් තිබුණාට
අහිංසක විලිලැජ්ජකාරයා
හිනාවෙන්නෙත් හොරෙන් - කට කොනින්.
ඩෙල්ට ටොපියක් දීල
ලැජ්ජාවෙ අත මිරිකුවා මගේ.

ජයසේන මුදලාලි
නියම බහිරව රූපෙ
හැබැයි හිත හරි හොඳයි
මනමාලයි
කවුන්ටරෙ ඉඳන් ඇස් ගහනවා
මං නොදැක්කා වගේ - කඩේ වැඩකරනවා.
මුදලාලි
බැනියමත් අකුලගෙන - බුරිය උඩ අත ගගා
කොයි වෙලෙත් මං දිහා බලනවා.
අන්න ඒකට බඩුව - මුදලාලි ගේ ගෑනි - සමදරා
සමදරා - යක්ෂණී
කොයි වෙලෙත් බර බරේ.
මුදලාලි හරි හොඳයි - මනමාලයි.

තේ කඩේ
පිටිපස්සෙ වම් පැත්තෙ කාමරේ
මං ඉන්නෙ.
කඩේ වැහුවට පස්සෙ
කළුවරේ ඇලවෙලා ඉන්නකොට
බීඩි සුවඳත් එක්ක
මිල්ටන්ගෙ සිංදුවක් පපුවට ම ගලනවා.
ඬේවිඩ් ප්‍රතිමාව හීනෙනුත් පේනවා.

මං
තනියම
තේ කඩේ පිටිපස්සෙ කාමරේ
අමු තිත්ත කරුවලේ.

මෙන්න
මගෙ ඇඳ ගාව
ඬේවිඩ් ප්‍රතිමාව.

හැබැයි ඊළඟ රෑක
අමු තිත්ත කළුවරේ - මගේ ළඟට ම එන්නෙ
ඬේවිඩ් ප්‍රතිමාව ද - බහිරව රූපෙ ද
මට සිහිය නෑ ඉතිං.
කමක් නෑ
මොක වුණත් - ඒ දෙක ම - ප්‍රතිමානෙ.

මේ ඉන්නෙ
ඉතාලියෙ
ලැජ්ජ බය දෙක ම නැති ඬේවිඩ් ද ?
එහෙම නැත්තං ඉතිං
කොට කලිසමක් අඳින
බේකරියෙ විලි ලැජ්ජ ඬේවිඩ් ද ?
එක්කො මේ ඬේවිඩ් ප්‍රතිමාව
එක්කො බහිරව රූපෙ
කමක් නෑ
ඒ දෙක ම - ප්‍රතිමානෙ.

කොහොම හරි
එකක් මං දන්නවා....
මයිකල් ආන්ජිලෝ
ඬේවිඩ් ප්‍රතිමාව ඇඹුවෙ
මේ අපේ බේකරියෙ - ඬේවිඩ් දිහා බලාගෙන.

පෝන් එකෙ
ටෝච් එක පත්තුකරගෙන ඇවිත්
අමු තිත්ත කරුවලේ.

මේ ඉන්නෙ
ඬේවිඩ් ප්‍රතිමාව ද
බහිරව රූපෙ ද
අමු තිත්ත කළුවරේ
හූනො චුක් චුක් ගෑවෙ.

මොක වුණත්
මුදලාලි ගේ ගෑනි සමදරා
කෙස් වල්ල කරකවල - මගේ කනටත් ගහල
වේසියක් කියල - මං කඩෙන් පැන්නුවා.
ඒ ගෑනි කියනකං
මං වේසියක් කියල - මං දැනං හිටියෙ නෑ.

කමක් නෑ
බඩල්කුඹුරෙ අපේ ගෙදර
මගේ අම්මා මාව බදාගෙන ඉන්නවා.
හඬේ හාවා වුණත් මගේ ගැන දන්නවා.
මගේ අම්මට ඉතිං - මං තාම හිච්චි ම යි.

රටේ උන්
කතන්දර කියපු දෙන්
බඩේ ඉන්නා එකා
මං ළඟ දි වදනවා.

උඟ ඬේවිඩ් වුණත් එකයි
උඟ බහිරව වුණත් එකයි
හැබැයි
උගෙ නම ඬේවිඩ්.

**කුමාර හෙට්ටිආරච්චි**

## ලොවේ හදිය මා දුටුයුරු

කාලය අබිබවා යන්නට ගිය ගමනේ
කන්නට බොන්නවත් අස්වැසුමක් නොගෙනේ
ලෝකය දිවගියාවූ ගමනක ලැසිනේ
සොබාදම ලොවට තරවටු කළ වැන්නේ

පියවි ඇසට නොපෙනෙන අනු ජීවයට
ලොවම නතු උනාදෝ මේ ආරයට
ලවක් දෙවක් නැති කඩිනම් උඟුරුවට
දිව ගිය දනා වැදි නිවසේ සිරගෙයට

දියණුව කියා ලොව ජයගත්තේ කිමද
යුතුකම බණ දහම අමතක වී නේද
සොබාදහම වනසා දැම්මා සබඳ
ඔබත් මාත් ගිය මග වැරදී නේද

දහසින් මියෙනවා අසරණ වෙලා අප
සහසින් මරණ බිය මුළු දියතටම කැප
දැහැමින් මැද මගට දැන්වත් පිවිස අප
සැනසුම් සොයමු සම්බුදු සිරි පතුල සිප

**තයාගා ගමගේ**